**ශීර්ෂය 316 - වයඹ පළාත් සභාව - 2025**

## 1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

තිරසර ලෙස සංවර්ධිත වයඹ පළාතක්

### 1.2 මෙහෙවර

වයඹ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින්, ගෝලීය තරඟකාරීත්වය තුළ තෘප්තිමත් ජනසමාජයක්, අනුවර්තනීය ආර්ථිකයක්, හරිත පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා භෞතික, මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණය.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

## 2. මූල්‍ය ප්‍රකාශන

**ශුද්ධ ප්‍රතිපාදනය උපයෝජනය හා ඉතිරිය**

වයඹ පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 66,617 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 65,507.62 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,109.38 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.67 ක පමණ ප්‍රතිපාදන ඉතිරියක් විය. එම මුළු ඉතිරියෙන් රු.මිලියන 516.75 ක් හෙවත් සියයට 6.20 ක් පමණ මූලධන ප්‍රතිපාදන වලින් වන අතර, පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරිය රු.මිලියන 592.63 ක් හෙවත් සියයට 1.02 ක් පමණ විය. අයවැය ඇස්තමේන්තුගත මුළු ප්‍රතිපාදන අක්මුදල් සපයාදීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරියක් පෙන්නුම් කර තිබුණි.

| **වියදම** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **2025 දෙසැම්බර් 31 දිනට** | | |
|---|---|---|---|---|
| | | **උපයෝජනය** | **ඉතිරිවීම** | **ඉතිරිවීම ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| පුනරාවර්තන | 58,283.00 | 57,690.37 | 592.63 | 1.02 |
| මූලධන | 8,334.00 | 7,817.25 | 516.75 | 6.20 |
| එකතුව | **66,617.00** | **65,507.62** | **1,109.38** | 1.67 |

## 3. විගණන නිරීක්ෂණ

ඉහත ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදු කර තිබුණි. පළාත් සභා අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.